## ශ්‍රී ලංකා
## ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## පාර්ලිමේන්තුව

---

# ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන)

**2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා විසින් 2022 අගෝස්තු මස 31 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 අගෝස්තු මස 12 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[147 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලබන අතර, එය 4 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය 4 වන වගන්තිය මගින් සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජිත පරිදි වූ ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වන බලතල, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන කමිටුව වෙත පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, "විදුලිබල සහ බලශක්ති විෂයය භාර අමාත්‍යවරයා" යන වචන වෙනුවට "අමාත්‍යවරයා" යන වචනය ආදේශ කිරීම වේ.

***6 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, "අමාත්‍යවරයා" යන යෙදුම සඳහා අලුත් අර්ථ නිරූපණයක් ඇතුළත් කිරීම සහ 4 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගිකව "බලශක්ති සැපයුම් කමිටුව" යන යෙදුමෙහි අර්ථ නිරූපණය ඉවත් කිරීම වේ.

***7 වන වගන්තිය*** : මේ වගන්තිය මගින්, සංශෝධන පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ක්‍රියාත්මක කරන ලද බලතල සහ කරන ලද ක්‍රියා සඳහා වලංගු භාවය ලබාදීම සඳහා විධිවිධාන සලස්වනු ලැබේ.

***8 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් අන්තර්කාලීන විධිවිධාන සලසනු ලබන අතර, ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ දැනටමත් නිකුත් කර ඇති බලපත්‍ර සඳහා, සංශෝධන පනතේ විධිවිධානවල අදාළත්වය ව්‍යාප්ත කිරීම වේ.

## ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන)

එල්.ඩී.—ඕ. 11/2022

### 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය*

**1.** (1) මේ පනත 2022 අංක  දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තිය හැර මේ පනතේ විධිවිධාන, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

*2002 අංක 33 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම*

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනතේ දීර්ඝ නාමය, එහි "බලශක්ති සැපයුම් කමිටුව" යන වචන වෙනුවට, "අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*"බලශක්ති සැපයුම් කමිටුව", "කමිටුව" ලෙස හැඳින්විය යුතු බව*

**3.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් ලිඛිත නීතියක, ප්‍රධාන ප්‍රඥප්තියට අදාළව, "බලශක්ති සැපයුම් කමිටුව" සම්බන්ධයෙන් ඇති සෑම සඳහනක් ම, "3 වන වගන්තිය යටතේ පත් කරන ලද කමිටුව" සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම්ගත යුතු ය.

(2) ප්‍රධාන ප්‍රඥප්තිය මගින් හෝ ඒ යටතේ නිකුත් කරන ලද, සාදන ලද, නියම කරන ලද හෝ බලය පවරන ලද යම් දැන්වීමක, සන්නිවේදනයක, ආකෘතියක හෝ වෙනත් ලේඛනයක, "බලශක්ති සැපයුම් කමිටුව" සම්බන්ධයෙන් ඇති සෑම සඳහනක් ම, "3 වන වගන්තිය යටතේ පත් කරන ලද කමිටුව" සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම්ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**4.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:–

"මේ පනත යටතේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා කමිටුවක් පත් කිරීම

3. (1) මෙහි මින්මතු දක්වා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා මේ වගන්තියේ මතු සඳහන් විධිවිධානවලට යටත්ව, (මෙහි මින්මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන කමිටුවක් තිබිය යුතු ය.

(2) කමිටුව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:–

(අ) නිල බලයෙන් පත් වන සාමාජිකයන්–

(i) කමිටුවේ සභාපතිවරයා විය යුතු, ඛනිජතෙල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ii) මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ නිලයට නොඅඩු නිලයක් දරනු ලබන තැනැත්තකු;

(ආ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයා හෝ කළමනාකාර අධ්‍යක්ෂවරයා;

(ඇ) ඛනිජතෙල් කර්මාන්තය හෝ නීතිය යන ක්ෂේත්‍රයන්හි ප්‍රවීණත්වයක් ලබා ඇති තැනැත්තන් අතරින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු.

(3) (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ පත් කරන ලද කමිටුවේ යම් සාමාජිකයකු විසින්,

අමාත්‍ය මණ්ඩලය අමතා යොමු කරන ලද ලිපියක් මගින් සිය ධූරයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ හේතු දක්වා අමාත්‍ය මණ්ඩලය විසින් ඔහු ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත් කරනු ලැබූ දිනයේ සිට වසර දෙකක කාලයක් සඳහා ඔහු ධූරය දැරිය යුතු ය.

(4) කමිටුවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු අතර, කමිටුව විසින්, කමිටුවේ රැස්වීම් සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල දී කරනු ලබන කටයුතු විධිමත් කරනු ලැබිය හැකි ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම**

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "විදුලිබල සහ බලශක්ති විෂයය භාර අමාත්‍යවරයා" යන වචන වෙනුවට "අමාත්‍යවරයා" යන වචනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම**

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) "ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:–

" "අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ මේ පනතට අදාළ විෂයය සහ කර්තව්‍ය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;" සහ

(2) "බලශක්ති සැපයුම් කමිටුව" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්.

**මේ පනත ආරම්භ කිරීමට පෙරාතුව සිදු කරන ලද ක්‍රියාවල වලංගු භාවය**

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට පෙරාතුව ම ප්‍රධාන ප්‍රඥප්තියෙන් පැවරී ඇති යම් බලයක් ප්‍රකාර ව, බලශක්ති සැපයුම් කමිටුව විසින් ක්‍රියාත්මක කරන ලද යම් බලයක් හෝ කරන ලද යම් ක්‍රියාවක් සියලු කාර්ය සඳහා, වලංගු ලෙස ක්‍රියාත්මක කරන ලද බවට සහ කරන ලද බවට සලකනු ලැබිය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ වලංගු ලෙස නිකුත් කර ඇති සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් ඔබ්බට දීර්ඝ වන්නා වූ යම් කාලසීමාවක් සඳහා එය අඛණ්ඩව බලාත්මක වන බවට එහි සඳහන් කර ඇති සෑම වලංගු බලපත්‍රයක්ම, එහි සඳහන් කාලසීමාව සඳහා අඛණ්ඩව බලාත්මක විය යුතු අතර, එවැනි සෑම බලපත්‍රලාභියකු, මේ පනතේ විධිවිධානවලට සහ මේ පනත යටතේ නීත්‍යානුකූලව පනවනු ලැබිය හැකි වෙනත් යම් නියම සහ කොන්දේසිවලට සහ ඒ යටතේ සාදනු ලැබිය හැකි වෙනත් යම් නියෝග හෝ රීතිවලට ද යටත් විය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**9.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.